# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (නාට්‍ය හා රංග කලාව) සතිඅන්ත-2017/2018
පළමු සෙමෙස්තර පරීක්ෂණය - 2018

## අධ්‍යාපන මනෝ විද්‍යාව - II කොටස

**පැය 2 විනාඩි 15**

ඕනෑම ප්‍රශ්න හයකට (06) පමණක් පිළිතුරු සපයන්න.

---

**1.** I. 'අධ්‍යාපන මනෝවිද්‍යාව' යන්න කෙටියෙන් හඳුන්වා එහි විෂය අන්තර්ගතය ආකෘතියක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

II. සෞන්දර්ය ගුරුවරයෙකුට අධ්‍යාපන මනෝවිද්‍යාවේ දැනුම සාර්ථක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියකට අවශ්‍ය වන්නේ මන්ද යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

**2.** I. ළමා වර්ධනය හා සංවර්ධනය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

II. මධ්‍ය ළමාවිය දරුවන් තුළ කායික, ප්‍රජානන හා මනෝ සමාජීය සංවර්ධනය සිදුවන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 6)

3. I. ඉගෙනුම් සාධනය පිළිබඳ සිසු අභිප්‍රේරණය විශ්ලේෂණය කළ හැකි එක් න්‍යායාත්මක ප්‍රවේශයක් විස්තර කරන්න.

(ලකුණු 6)

II. ඉහත (i) හි පෙන්වා දුන් න්‍යායාත්මක ප්‍රවේශයට අනුව ඉගෙනුම් සාධනය උදෙසා සිසු අභිප්‍රේරණය වැඩි දියුණු කිරීමට ඉටු කළ හැකි ගුරු කාර්යභාරය පෙන්වා දෙන්න.

(ලකුණු 6)

4. I. ඉගෙනුම පිළිබඳ චර්යාවාදී මතය හා ප්‍රජානන මතය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

II. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ගුරුවරයෙකුට ඉගෙනුම සම්බන්ධිත චර්යාවාදී හා ප්‍රජානන න්‍යායයන් භාවිත කළ හැක්කේ කෙසේද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

5. I. 'පෞරුෂය' යන්න නිර්වචනය කර, පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක 4 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

II. පෞරුෂ සංවර්ධන න්‍යායන්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සෞන්දර්ය ගුරුවරයකුට ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 6)

6. I. බහුවිධ බුද්ධි න්‍යායේ බුද්ධි වර්ග අට පැහැදිලි කරන්න. (ලකුණු 6)

II. බහුවිධ බුද්ධි නිපුණතා සිසුන් තුළ සංවර්ධනය කිරීමට වෘත්තීය ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 6)

7. I. සංවේදනය, අවධානය හා සංජානනය හඳුන්වන්න.

(ලකුණු 6)

II. අවධානය හා සංජානනය යන ප්‍රජානන ක්‍රියාවලීන් පිළිබඳ න්‍යායාත්මක දැනුම නාට්‍ය හා රංග කලාව ගුරුවරයකුට වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 6)

8. I. විශේෂ අවශ්‍යතා ඇති ළමයින් යනු කවරෙක්දැයි හඳුන්වා සාමාන්‍ය පන්තිකාමරයේදී මුණගැසිය හැකි විශේෂ අවශ්‍යතා ළමයින් වර්ගකර දක්වන්න.

(ලකුණු 6)

II. ඔබ දන්නා විශේෂ අවශ්‍යතා සහිත ළමයකුගේ ලක්ෂණ සඳහන් කර සෞන්දර්යය වෘත්තීය ගුරුවරයකු ලෙස ඔහුට සහාය විය හැකි ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 6)

O∘O∘O∘O∘O∘O∘O∘